ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට ක්ෂය රෝග මර්දන ඖෂධ තොගයක්

ඉන්දිය රජය විසින් අද දින ක්ෂය රෝග මර්දන අත්‍යවශ්‍ය ඖෂධ තොගයක් කොළඹ සෞඛ්‍ය අමාත්‍යාංශයේදී ශ්‍රී ලංකා රජය වෙත භාර දෙන ලදී. මෙම ඖෂධ තොගය ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු වෛද්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා වෙත භාර දෙන ලදී. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය හංසක විජේමුණි මහතා ද මමෙ අවස්ථාවට සහභාගී විය.

2. ඉන්දියාව විසින් මමෙ අත්‍යවශ්‍ය ක්ෂය රෝග ඖෂධ තොගය ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි පරිත්‍යාග කරන ලදී. ඉන්දිය රජයේ සෞඛ්‍ය සහ පවුල් සුබසාධන අමාත්‍යාංශයේ සහයෝගයෙන් මමෙ ඖෂධ තොගය ලබා ගන්නා ලදී.

3. ටොන් තුනක් පමණ බරැති තොගයට ශ්‍රී ලංකා රුපියල් මිලියන 52ක් වටිනා ප්‍රථම පලෙ ක්ෂය රෝග නාශක පනේ මිලියන 1.5ක් ඇතුළත් වන අතර ඒවා ශ්‍රී ලංකාවේ ක්ෂය රෝගීන් සඳහා ප්‍රතිකාර ලබා දීමේ අඛණ්ඩතාවය සහතික කිරීමට ඉවහල් වනු ඇත.

4. මමෙ සහයෝගය ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය අවශ්‍යතා සඳහා ඉන්දියාව ලබා දෙන කාලීන ප්‍රතිචාර සඳහා තවත් උදාහරණයකි. 2026 අගෝස්තු මාසයේදී ඉන්දියාව ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි ඩෙංගු මර්දන ප්‍රයත්නයන්ට සහය ලබා දමෙන් තාක්ෂණික ශ්‍රේණියේ මැලතියන් ලීටර් 500ක් ශ්‍රී ලංකාවට පරිත්‍යාග කළේය.

5. ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශ අතර දිගුකාලීන සහ පුළුල් පරාසයක් පුරා විහිදුණු හවුල්කාරිත්වයක් පවතී. ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා ලබා දී ඇති සංවර්ධන සහයෝගයන් අතරට රෝහල් සහ සෞඛ්‍ය සේවා පහසුකම් ඉදිකිරීම සහ වැඩිදියුණු කිරීම, ඖෂධ සහ වෛද්‍ය උපකරණ සැපයීම සහ ධාරිතා සංවර්ධනය සහ පුහුණුව යනාදිය ඇතුළත් වේ. ඉන්දියාව හදිසි අවස්ථාවන්හිදි සහ හදිසි වෛද්‍ය අවශ්‍යතාවයන්හිදි ද ශ්‍රී ලංකාවට සහය ලබා දී ඇත.

6. අද දින ලබා දුන් මමෙ ක්ෂය රෝග මර්දන ඖෂධ තොගය තුළින් ශ්‍රී ලංකාව සමඟ පවතින ජනතා කේන්ද්‍රීය සංවර්ධන හවුල්කාරිත්වය සඳහා ඉන්දියාවේ කැපවීම පිළිබිඹු වේ. ශ්‍රී ලංකා රජය සහ ජනතාව විසින් හඳුනාගන්නා ලද ප්‍රමුඛතාවයන්ට අසල්වැසියා ප්‍රථමයනේ යන ප්‍රතිපත්තිය මත පදනම්ව ප්‍රතිචාර ලබා දීම ඉන්දියාවේ අරමුණ වේ.

***

කොළඹ
2026 ඔක්තෝබර් *07*